# 4 ලෝකය මැවීමේ පුවත



4.1 රූපය - දේව මැවිල්ල

දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණෝ ය. අපට ඇති අසීමිත ආදරය නිසා ආශ්චර්යමත් හා විවිධත්වයෙන් යුත් දේව මැවිලි ලබා දී ඇත. එම නිසා දේව මැවිල්ලට අපි ආදරය කළ යුතු වෙමු.

තම වචනයේ බලයෙන් දෙවියන් වහන්සේ ලෝකය මැවූ අයුරු ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ සඳහන් වේ. එම බයිබල් පාඨ කියවා බලමු.

## දවාල හා රාත්‍රිය

පොළොව හිස් ව පාළු ව තිබිණි. මහ සයුර මත අන්ධකාරයක් විය. දේවාත්මානුභාවය ජලය මතු පිට හැසුරුණේ ය. එවිට දෙවියන් වහන්සේ, "ආලෝකය වේවා!" යි වදාළ සේක; ආලෝකය විය. ආලෝකය මනහර බව උන් වහන්සේ දුටු සේක. උන් වහන්සේ අන්ධකාරයෙන් ආලෝකය වෙන් කර ආලෝකයට "දවාල" කියා ද, අන්ධකාරයට "රාත්‍රිය" කියා ද නම් තැබූ සේක........ ඒ පළමු වන දවස ය. (උත්පත්ති 1:2-5)

## අහස හා ජලය

ඉන්පසු දෙවියන් වහන්සේ, "ජලය ස්ථාන දෙකක වෙන් වෙන් ව පවතින පිණිස එය වෙන් කරන අහස් කුස වේ වා!"යි වදාළ සේක. එසේ ම විය. මෙසේ උන් වහන්සේ අහස් කුස සාදා ඊට යටින් තිබෙන **ජලය**, ඊට උඩින් තිබෙන ජලයෙන් වෙන් කර අහස් කුසට "**අහස**" කියා නම් තැබූ සේක ...... ඒ **දෙවන දවස** ය.

(උත්පත්ති 1:6-8)

## ගොඩබිම හා ගස් කොළන්

ඉන්පසු දෙවියන් වහන්සේ "ගොඩබිම මතු වන පිණිස අහස යට තිබෙන ජලය එක තැනකට රැස් වේවා!" යි වදාළ සේක. එසේ ම විය. **ගොඩබිමට** "පොළොව" කියා ද, ජලයට " සාගරය" කියා ද උන් වහන්සේ නම් තැබූ සේක........ දෙවියන් වහන්සේ "බීජ උපදවන ඇට සහිත ඵල දරන, සියලු වර්ගවල **ගස්කොළන්** භූමියේ හටගැනේ වා!" යි වදාළ සේක. එසේ ම විය. මෙසේ භූමිය බීජ උපදවන, ඇට සහිත ඵල දරන, සියලු වර්ගවල ගස් කොළන් නිපදවිය.......... ඒ **තුන් වන දවස** ය.

(උත්පත්ති 1:9-13)

## ඉර, හඳ හා තාරකා

මෙසේ දෙවියන් වහන්සේ ප්‍රධාන ආලෝක දෙකක් එනම් දවාල පාලනය කිරීම සඳහා **ලොකු ආලෝකය** ද රාත්‍රිය පාලනය කිරීම සඳහා **කුඩා ආලෝකය** ද සෑදූ සේක; **තාරකා** ද සෑදූ සේක. දෙවියන් වහන්සේ මේ ආලෝකයන් අහසේ තැබුවේ පොළොවට ආලෝකය දීම සඳහාත්, දවාල හා රාත්‍රිය පාලනය කිරීම සඳහාත් අඳුරින් ආලෝකය වෙන් කිරීම සඳහාත් ය ........ ඒ **සතර වන දවස** ය.

(උත්පත්ති 1:16-19)

## පක්ෂීන් හා මසුන්

මෙසේ දෙවියන් වහන්සේ දූවැන්ත **තල් මසුන්** ද ඔබමොබ පීනන නන් වැදෑරුම් **ජලජ සතුන්** ද නන් වැදෑරුම් **පක්ෂීන්** ද මැවූ සේක ........ තව ද දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, "බෝ වී වැඩී වර්ධනය වී මුහුදු ජලය පුරා පැතිරෙත් වා! කියා ද, "පක්ෂීහු පොළොවේ බෝවෙත් වා!" කියා ද පැවසූ සේක ....... **ඒ පස් වන දවස** ය.

(උත්පත්ති 1:21-23)

## සතුන් හා මිනිසා

දෙවියන් වහන්සේ, "විවිධ **ගවමහීෂයන්** ද **උරගයන්** ද වන මෘගයන් ද යන **ජීවමාන සත්ත්වයෝ** පොළොවෙන් නිපදෙත් වා!" යි වදාළ සේක. එසේ ම විය ........ දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව **මිනිසා** මැවූ සේක; දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක. **පුරුෂයා** ද **ස්ත්‍රිය** ද වශයෙන් ඔවුන් මැවූ සේක ......... **ඒ සය වන දවස** ය.

(උත්පත්ති 1:24-27)

ඉහතින් දක්වා ඇති ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ පාඨයන්ගෙන් අපට දැනගත හැක්කේ, දෙවියන් වහන්සේ දින හයක් තුළ ලෝකය මැවූ බව ය. මේ සියලු මැවිලි දේව නිර්මාණ බව ශුද්ධ බයිබලයේ ගීතාවලිය පොතේ 104 පරිච්ඡේදයෙන් ද අපට පැහැදිලි කර දෙයි.

දෙවියන් වහන්සේ මුළු විශ්වය නිර්මාණය කිරීමේ දී මිනිසාගේ සියලු අවශ්‍යතා ගැන සැලකිලිමත් වූ සේක. එදිනෙදා ජීවිතය පවත්වා ගෙන යාමට අවශ්‍ය දෑ මැවිල්ල තුළ ඇති කළ සේක. මිනිසාට ජීවත් වීමට අවශ්‍ය පරිසරය ද ලබා දුන් සේක.

දෙවියන් වහන්සේගේ උතුම් ම මැවිල්ල වූ අපි, සැම විට ම දේව මැවිල්ල අගය කිරීමට අදිටන් කර ගනිමු. මේ උතුම් වූ ලෝකය මවා දුන් දෙවි පියාණන්ට තුති ප්‍රශංසා කරමු.

**ක්‍රියාකාරකම**

(1) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| දිනය | මැවිලි |
|---|---|
| 1 වන දිනය | |
| 2 වන දිනය | |
| 3 වන දිනය | |
| 4 වන දිනය | |
| 5 වන දිනය | |
| 6 වන දිනය | |

(2) දෙවියන් වහන්සේ මිනිසා මැව්වේ කීවෙනි දවසේ ද?

(3) දේව මැවිල්ල ගැන කියැවෙන ගීතිකාවක් ලියන්න.

(4) පහත පින්තූරය දෙස බලන්න. මේ දේව නිර්මාණය කොතරම් අගනේ ද? ශුද්ධ බයිබලයේ ගීතාවලිය පොතේ 104 පරිච්ඡේදයේ 8-13 වගන්ති කියවා දේව නිමැවුමේ අසිරිය අගයමින් කවි පෙළක් නිර්මාණය කරන්න.



4.2 රූපය - දේව නිර්මාණයක්

(5) ශුද්ධ බයිබලයේ ගීතාවලිය පොතේ 104 පරිච්ඡේදයේ 14-18 වගන්ති හා 33-34 වගන්ති කියවා, එහි ඇති අදහස් අනුව මිනිසාට අවශ්‍ය පරිසරය ලබා දුන් දෙවි පියාණන් වහන්සේට ස්තුති කරමින් යාච්ඤාවක් ලියන්න.

(6) ශුද්ධ බයිබලයේ ගීතාවලිය පොතේ 104 පරිච්ඡේදයේ 19-30 වගන්ති හොඳින් කියවා, එහි ඇති අදහස් චිත්‍රයකට නඟන්න.



**ජීවිතයට බිඳක්**

- ★ *දේව මැවිල්ල අගය කරමු.*
- ★ *සතුන්ට හා ගහකොළට ආදරය කරමු.*
- ★ *නිවස හා පාසල අලංකාරවත් ලෙස පවත්වා ගනිමු.*
- ★ *දේව මැවිල්ලේ අසිරිය බලා දෙවි පියාණන් වහන්සේට තුති ප්‍රශංසා කරමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.